# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,258 — 1964 දෙසැම්බර් 16 වැනි බදාදා — 1964.12.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

ඇල් ඕ.—බී. 9/64 (54).

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම, 1964 ජූලි 3 වැනි දින අංක 14,094 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ මල්ලකම් ගම් ප්‍රදේශයට අදාළ නිවේදනය, ඊට යාකොට ඇති උපලේඛනයේ II වැනි තීරයේ, අංක 3 දරන නාක්කනාවතෙයි ඡන්ද කොට්ඨාශයේ මායිම් පිළිබඳ විස්තරය වෙනුවට පහත සඳහන් විස්තරය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි:—

උතුරට: පතුපන්තෙයියඩි පටුමග මායිම කැපී යන ස්ථානය වන සන්ඩිලිපෙ මායිමේ ලක්ෂ්‍යයක සිට ද, එතැන් සිට පල්ලිය පටුමග හමුවන සේ ඉල්ලන්නකඩ්ඩි වෛයිරවාර් කෝවිල් පටුමගේ උතුරු මායිම අද්දර දිගේ පතුපන්තෙයිඩි පටුමග ඔස්සේ නැගෙනහිර දෙසට ද, එතැන් සිට පල්ලිය පටු මග ඔස්සේ, එකී පටුමග චන්කණෛයි-වල්ලායි රජයේ වැඩ දෙපාර්තමේන්තු පාර සමග සන්ධි වන ස්ථානයේ මධ්‍යය හමුවන සේද;

නැගෙනහිරට: අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට මහියපිඩ්ඩි ගම් සීමා හමුවන සේ චන්කාණෛයි-වල්ලායි පාර ඔස්සේ දකුණු දෙසට ද;

දකුණට: මහියපිඩ්ඩි ගම් සීමා වලින් ද;

බස්නාහිරට: සන්ඩිලිප්පේ සහ සිරුවිලන් ගම් මායිමෙන්.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1964 දෙසැම්බර් 15 වැනි දින,
කොළඹදීය.

12-970


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1115—ආර් 2640—4,775 (64/12)